**කැලණිය විශ්වවිද්‍යාලය - 2016**
**----------------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශනවලින් **2016** දෙසැම්බර් **31** දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරන අගයෙන් සැලකිය යුතු තරම් වෙනස්වීම්වලින් යුක්ත වන්නේ නම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත් 2016 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.724,931,142 ක් ලෙස දක්වා ඇති විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූල අයිතිය ඇති ඉඩම් 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව අවසන් තොගය රු.32,474,645 ක් වුවද ලෙජර ගිණුම අනුව එම ශේෂය රු.23,517,539 ක් වූයෙන් අවසන් තොගය රු.8,957,106 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් 2012 වර්ෂයේ විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් රු.266,980 ක් වූ කාර්යාල උපකරණ අපහරණය කර තිබුණත් එම වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණු අතර රු.233,197 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම එම ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් රු.3,258,129 ක් වූ කාර්යාල උපකරණ හා රු.1,117,655 ක් වූ ඉගැන්වීම් උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |

| | | |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46(6) (VII) වගන්තිය | විශ්වවිද්‍යාලයේ පාලක සභා අනුමැතිය මත පමණක් පර්යේෂණ සභාවක් පිහිටුවා තිබුණු අතර එම පර්යේෂණ සභාවේ සභාපති වෙත වැටුපෙන් සියයට 25 ක දීමනාවක් ගෙවීමටද අනුමත කර තිබුණි. එම සභාපතිවරයා සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි මාස 05 ක කාලය සඳහා ද ඔහුට එම දීමනා ලෙස රු.112,019 ක් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>**(i)** මුදල් රෙගුලාසි 371 (2) | අත්තිකාරම් මුදල් ලබාදුන් කාර්යය නිමකළ විගස පියවීමට කටයුතු කළයුතු වුවත් ජාත්‍යන්තර සමුළු අත්තිකාරම් රු.5,231,300 ක් හා පර්යේෂණ සඳහා වු අත්තිකාරම් රු.1,169,060 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 394 | 2008 නොවැම්බර් 24 දින සිට 2016 ජුනි 22 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවලංගු කරන ලද එකතු වටිනාකම රු.2,240,557 ක් වු චෙක්පත් 467 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකර මුලා ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 570 හා 571(3) | වසර 02 සිට වසර 09 දක්වා කාලයක සිට පැවත එන රු.14,483,952 ක් වටිනා ටෙන්ඩර්, ආරක්ෂක හා විවිධ තැන්පතු 2017 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 757 | 2016 දෙසැම්බර් 31 දිනට වු තොග සමීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය වු රු.3,275,687 ක තොග ඌනතා හා රු.1,327,930 ක තොග අතිරික්තතා හඳුනාගෙන තොග පොත් නිවැරදි කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සිදුකර නොතිබුණි. |
| | (**v**) මුදල් රෙගුලාසි 770,772 හා 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 | • වසර 02 සිට වසර 10 දක්වා අතර කාලයක සිට නිකුත් නොවී පවතින වටිනාකම පිළිවෙලින් රු.1,491,834 ක් හා රු.1,436,333 ක් වූ භාණ්ඩ හා හානි වු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.<br>• 2012 වර්ෂයේ සිදුකළ පුස්තකාල පොත් සමීක්ෂණයේදී හඳුනාගත් අස්ථානගත වු පොත් 35,159 ක වටිනාකම වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2004 ජනවාරි 26 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/01 දරන චක්‍රලේඛය | 2012 වර්ෂයෙන් පසු පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (**i**) 4.2 (අ) වගන්තිය | (i) 2016 වර්ෂයේ දී පිළියෙල කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම එම ප්‍රසම්පාදන සැලැස්මේ විශ්වවිද්‍යාල අරමුදල් යොදවන ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධ විස්තර ඇතුළත් කර නොතිබුණි. |

(ii) අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කළ යුතු වුවත් එසේ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ii)** 4.2.2 සහ 4.2.3 වගන්ති — ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.495,212,649 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.474,804,754 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,407,895 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික රු.174,170,879 කින් වැඩි වී තිබුණද, රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.186,000,000 කින් වැඩිවීම සහ පොලී ආදායම රු.95,426,256 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ අතිරික්තය අඩුවීමක් තිබුණද 2012, 2013, 2015 හා 2016 වර්ෂය දක්වා අතිරික්තයේ වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.1,279,201,888 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු.2,685,538,387 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ශිෂ්‍යයන් ඇතුළත්කර ගැනීම, ඉගැන්වීම සඳහා විධිවිධාන සැලසීම, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම, විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණතාවය ලැබුවන් නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම, බාහිර විභාග පැවැත්වීම, විශ්වවද්‍යාලයේ කාර්යයන් සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉගැන්වීමේ හෝ පදිංචි කිරීමේ කාර්ය සඳහා ඉදිකිරීම, මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු ඇති කිරීම, ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව පදක්කම් හා ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය, ආදිය විශ්වවිද්‍යාලයේ කාර්යයන් ලෙස 1978 අංක 16 දරන පනතින් සංශෝධිත 1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියකාරී සැලැස්මෙහි ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු 04 ක් අංශ 08 යටතේ දක්වා තිබුණු අතර එම අංශ 08 හි ඉලක්ක 974 ක් ඇතුළත්ව තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය පරීක්ෂා කර බැලීමේදී මුළු ඉලක්කවලින් සියයට 38 ක් පමණක් අවසන් කර තිබුණු අතර සියයට 32 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව ක්‍රියාත්මක නොකළ ඉලක්ක ගණන සියයට 30 ක් විය.

(ආ) **අධ්‍යයන කාර්යසාධනය**

**(i)** සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 9,542 ක් විය. පළමු වසර සඳහා ඇතුළත් කරගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 2,635 ක් වුවත් සිසුන් 2,734 ක් ඇතුළත් කරගෙන තිබුණි. වාණිජ හා කළමනාකරණ පීඨය හා විද්‍යා පීඨය සඳහා ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා පිළිවෙලින් 58 ක් හා 51 ක් අඩුවෙන් ඇතුළත් කරගෙන තිබුණි.

**(ii)** වෛද්‍ය පීඨය විසින් 2007/2008 අධ්‍යයන වර්ෂයේදී ආරම්භ කර තිබුණු කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂයේ බඳවාගත් සිසුන් 50 කින් සිසුන් තිදෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණු අතර ඉකුත් වර්ෂයේ බඳවාගත් සිසුන් 44 න් සිසුන් 11 ක් පාඨමාලාව හැර ගොස් තිබුණි.

(ඇ) **බාහිර විභාග පාඨමාලා පැවැත්වීම**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** **1978** අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 29(ඊ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබාගත හැකිවන පරිදි කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව බාහිර විභාග පැවැත්වීම සඳහා බලතල ලබාදී තිබුණි.ඒ අනුව කැළණිය විශ්වවිද්‍යාලය විසින්ද බාහිර විභාග පාඨමාලා 06 ක් පවත්වා ගෙන යන අතර 2016 දෙසැම්බර් 31 වන විට මුළු ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 95,906 ක් විය.මෙම පාඨමාලා පැවැත්වීම තුළින් විශ්වවිද්‍යාලය විසින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව **1,542,947,059** ක ආදායමක් උපයා තිබුණු අතර වියදම ඉක්මවූ ආදායම සියයට 84 සිට සියයට 541 පරාශයක පැවතුණි. විශ්වවිද්‍යාලය විසින් 2014 වර්ෂයේදී පාඨමාලා ගාස්තු සංශෝධනය කර තිබුණු අතර පාඨමාලා අනුව එහි සියයට 193 සිට සියයට 438 ක් දක්වා ගාස්තු වැඩිවීමක් නිරීක්ෂණය විය. ඉහත පරිදි වියදම ඉක්මවූ ආදායමේ වර්ධනයක් පෙන්නුම් කර තිබියදී පාඨමාලා ගාස්තු වැඩිකිරීමේ අවශ්‍යතාවය විගණනයේ දී පැහැදිලි නොවුණි.

**(ii)** ඉහත සඳහන් පරිදි ගාස්තු අය කර තිබුණද විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර එම කාලය මාස **01 සිට වර්ෂ 06½** දක්වා කාල පරාසයක් ගෙන තිබුණි .

(ඈ) **පර්යේෂණ කටයුතු**

---------------------

**(i)** භාණ්ඩාගාර පර්යේෂණ ප්‍රදාන

- සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ ව්‍යාපෘති 11 ක් සඳහා රු.2,**525**,000 ක් වෙන්කර තිබුණද වර්ෂය අවසානයට එම පර්යේෂණ 11 සඳහා රු.894,077 ක් මෙයින් උපයෝජනය කර තිබුණි.

- 2015 වර්ෂය සඳහා අනුමත කළ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් 2017 සැප්තැම්බර් 08 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

- මෙම පර්යේෂණ ව්‍යාපෘති සඳහා අනුමත කරන ලද කාලයද බොහෝ අවස්ථාවල දීර්ඝ කර තිබුණු අතර ආචාර්යවරු අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීම සහ දත්ත රැස්කිරීම හා පර්යේෂණ කටයුතු ප්‍රමාදවීම මේ සඳහා හේතුවන බව උපකුලපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පර්යේෂණ දිරිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.22,000,000 ක් ලබා දී තිබුණු අතර ඉන් ආචාර්යවරුන් 15 ක ගේ පර්යේෂණ 17 ක් සඳහා රු.12,872,344 ක් වැයකර තිබුණි. වර්ෂය අවසානයේ රු.9,127,656 ක් ඉතිරිවී පැවතුණු බැවින් උපයෝජනය සියයට **59** ක් විය.

(iii) විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.28,257,735 ක ශේෂය තුළ ඇතුළත් රු.9,283,020 ක් වූ ශේෂ 02 ක් 2011 වර්ෂයේ සිටම උපයෝජනය කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතු පර්චස් 60 ක බිම් කොටසක් 1980 වර්ෂයේ සිට මහජන බැංකුව වෙත ලබා දී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම බිම් කොටස වෙනුවෙන් බදුකුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් 1978 වර්ෂයේදී පර්චස් 19.2 ක ඉඩමක් රු.1,600,000 කට මිලදී ගෙන තිබුණු අතර මිලදී ගත් දිනයේ සිටම එය විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.11,923,200 ක මුදලකට පෞද්ගලික පාර්ශවයකට විකුණා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛණගත කිරීම සඳහා 2007 වර්ෂයේදී රු.1,200,000 ක් වැය කර පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කර තිබුණත් 2012 වර්ෂයෙන් පසු එය යාවත්කාලීන කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 වන පරිච්ජේදයේ 33 ජේදය ප්‍රකාරව ගිවිසුම් කඩකරන ආචාර්යවරුන්ගේ ගිවිසුම් ප්‍රකාර දඩ මුදල් අයකරගත යුතු වුවත් 2017 ජුනි 30 දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 19 දෙනෙකුගෙන් රු.57,238,122 ක මුදලක් අය විය යුතුව පැවතුණි. එයින් 16 දෙනෙකුම ආධුනික කථිකාචාර්යවරුන් විය.

(ආ) බැඳුම්කර වටිනාකම වාරික වශයෙන් ගෙවීම් පදනම සඳහා ඉඩ සළසා තිබුණු අතර වාරිකයක අගය හා කාලය තීරණය කිරීමේදී අයවිය යුතු මුදලින් ඉතා කුඩා වාරික වශයෙන් ගෙවීමට එකඟ වීම නිසා මුදල් අයවීමේ දී වර්ෂ 10 -15 ත් අතර දිගු කාලයක් ගත වන බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ ගිවිසුම් කඩකල නිළධාරීන් හතර දෙනෙකු සිටි අතර ඉන් දෙදෙනෙකුගේ ගිවිසුම් ගත මුදල ගණනය කර නොතිබුණි.

## 4.4 කොන්ත්‍රාත් ක්‍රියාවලියේ අඩුපාඩු

------------------------------------

තොරතුරු හා සංන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.157,593,998 ක ඇස්තමේන්තුවකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ 2014 දෙසැම්බර් 24 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2015 ජනවාරි 16 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.34,985,842 ක් ගෙවා තිබුණි. එහෙත් සැලසුම්කළ භූමියේ ඉදිකිරීම් ආරම්භ කරනු වෙනුවට නව ඉඩමක් මිලදී ගෙන සැලසුම්

සකස්කර ඉදිකිරීම් සිදුකිරීම හේතුවෙන් 2016 ඔක්තෝබර් මාසය දක්වාම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර රජයේ මුදල් වර්ෂයකට අධික කාලයක් බාහිර පාර්ශවයන් වෙත නිෂ්කාර්යව රඳවා තිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු සිදුවී ඇත්තේ අවස්ථා 02 කදී පමණක් වූ අතර රු.3,549,248 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් පවත්වාගෙන යන බව එක් එක් මාසය අවසානයේ බැංකුවේ පැවති ශේෂයන් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාල අරමුදල යටතේ පවතින රු.120,000,000 ක් වූ අරමුදල් 02 ක් 2015 වර්ෂයේ සිට උපයෝජනය කර නොතිබුණු අතර 2012,2013 හා 2015 වර්ෂවල විශේෂ අරමුණු සඳහා ලැබුණු ප්‍රදානවලින් පිළිවෙලින් රු.5,423,868 ක්, රු.1,026,890 ක් හා රු.8,460,434 ක් එම අරමුණු සඳහා යෙදීමකින් තොරව බැංකු ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර අනුමත තනතුරු සංඛ්‍යාව 649 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 542 කි. ඒ අනුව පැවති 107 ක් වූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 22 ක්ම විශ්‍රාමික මහාචාර්ය පුරප්පාඩු විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද ආචාර්යවරු 47 දෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන තිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය (තාවකාලික) සඳහා අනුමත සේවක සංඛ්‍යාව 122 ක් වුවත් තථ්‍ය සංඛ්‍යාව 321 ක් වුයෙන් අතිරික්ත සංඛ්‍යාව 199 ක් විය.

(ඇ) අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 95 ක් විය.

**5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය**

-----------------------------------

**5.1 ක්‍රියාකාරි සැලැස්ම**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සඳහා වර්ෂයේ අරමුදල් ලැබීම්, රජයේ ප්‍රදාන, වෙනත් ප්‍රදාන හා උපයන ලද ආදායම් ආදිය වෙන් වෙන්ව හඳුනාගෙන එක් එක් පීඨ අතර බෙදාහැරීම පිළිබඳව සාරාංශ සටහනක් කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

(ආ) සමාජ විද්‍යා පීඨයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ඉලක්ක සහ විශේෂ අරමුණු 18 ක් දක්වා තිබූ අතර ඒ සඳහා අරමුදල් යොදවන ආකාරය සහ වර්ෂයේ කාර්යසාධනය හා මානව ශාස්ත්‍ර පීඨයේ 2016 ජූලි සිට දෙසැම්බර් දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | පුස්තකාල පොත් සමීක්ෂණය | පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | ඉදිකිරීම් ප්‍රමාද වීම් හා වරින්වර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම. |
| (ඈ) | අත්තිකාරම් පාලනය | අත්තිකාරම් පියවීම ප්‍රමාද වීම. |
| (ඉ) | ගබඩා පාලනය | තොග ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හා ප්‍රායෝජනයට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීම ප්‍රමාද වීම. |